ශ්‍රී ලංකා මහ බැංකුව
இலங்கை மத்திய வங்கி
CENTRAL BANK OF SRI LANKA

සේවක අර්ථසාධක අරමුදල් දෙපාර්තමේන්තුව
ஊழியர் சேமலாப நிதியத் திணைக்களம்
EMPLOYEES' PROVIDENT FUND DEPARTMENT

අංක 30, ජනාධිපති මාවත, කොළඹ 01, ශ්‍රී ලංකාව
இல. 30, சனாதிபதி மாவத்தை, கொழும்பு - 01, இலங்கை
No. 30, Janadhipathi Mawatha, Colombo 01, Sri Lanka

2025/09/23

ඊවිස් පෙරිෆෙරල්ස් (පුද්) සමාගම
අංක 142,
[illegible], ගාලු පාර,
කොළඹ 03

EWIS PERIPHERALS (PVT) LTD.
27 SEP 2025
RECEIVED

මහත්මයාණෙනි/මහත්මියනි,

<u>ජාතික හඳුනුම්පත් තොරතුරු මත සාමාජිකයන් නැවත ලියාපදිංචි කිරීමේ ව්‍යාපෘතිය
දෝෂ සහිත RR ආකෘති පත්‍ර නිවැරදි කරවා ගැනීම</u>

ඔබ ආයතනයේ සේවකයන් ඉහත ව්‍යාපෘතිය යටතේ නැවත ලියාපදිංචි කිරීම සඳහා ඔබ විසින් අප වෙත එවන ලද RR ආකෘති පත්‍ර සම්බන්ධවයි.

ඔබ ආයතනය ඉදිරිපත් කර තිබූ RR ආකෘති පත්‍ර වලින් ....2....... ප්‍රමාණයක් මේ සමඟ ඔබ වෙත එවා ඇති අතර, ඉතිරි ආකෘති පත්‍ර නැවත ලියාපදිංචි කිරීමේ කටයුතු සඳහා යොමු කර ඇත. ඒ සම්බන්ධ තොරතුරු පසුව දැනුම් දෙනු ලැබේ.

එම ආකෘති පත්‍ර වල පහත සලකුණු කර ඇති දෝෂය/දෝෂ ඇති බවට හඳුනාගෙන තිබේ. එබැවින් එම සාමාජික තොරතුරු නැවත ලියාපදිංචි කිරීම සඳහා යොමු කළ නොහැකි බව දන්වා සිටින අතර, ඒවා නිවැරදි කරවා ගැනීම සඳහා මේ සමඟ ඔබ වෙත එවමු.

1. ජාතික හැඳුනුම්පත් (ජා.හැ.ප.) වල ඡායා පිටපත් එවා නොමැති වීම / අපැහැදිලි ජාතික හැඳුනුම්පත් ඡායා පිටපත් එවා තිබීම. (මෙම පිටපත් සේව්‍යයා විසින් සත්‍ය පිටපත් බවට සහතික කර තිබිය යුතුය).
2. ජා.හැ.ප. වෙනුවට රියදුරු බලපත්‍ර/ගමන් බලපත්‍ර ඉදිරිපත් කර ඇතත් ඒවා පු.ලි.දෙ. දත්ත පද්ධතියේ සඳහන් නොවීම/පු.ලි.දෙ. දත්ත පද්ධතියේ තොරතුරු අපැහැදිලි වීම.
3. ~~සම්පූර්ණ කරන ලද RR ආකෘති පත්‍රය සේව්‍යයා විසින් අත්සන් කර නිල මුද්‍රාව තබා සහතික කර නොමැති වීම.~~
4. ඉදිරිපත් කර ඇති තොරතුරු නිවැරදි බවට සාමාජිකයන් අත්සන් කර නොතිබීම.
5. සාමාජිකයා අත්සන් කළ යුතු ස්ථානයේ සේව්‍යයා අත්සන් කර තිබීම.
6. සේව්‍ය අංකය සඳහන් කර නොමැති වීම.
7. ~~සාමාජික අංක සඳහන් කර නොමැති වීම.~~
8. සම්පූර්ණ කරන ලද RR ආකෘති පත්‍රයේ මුල් පිටපත වෙනුවට එහි ඡායා පිටපත එවා තිබීම.

නිවැරදි කරන ලද RR ආකෘති පත්‍ර නැවත ලියාපදිංචි කිරීමේ අංශය, සේවක අර්ථසාධක අරමුදල, ශ්‍රී ලංකා මහ බැංකුව, අංක 30, ජනාධිපති මාවත, කොළඹ 01 යන ලිපිනයට ලැබීමට සලස්වන මෙන් මෙයින් දන්වා සිටිමු. මේ පිළිබඳ කවදුරටත් පැහැදිලි කර ගැනීම අවශ්‍ය වේ නම් කරුණාකර .......0112206685....... අමතන්න.

මෙයට - විශ්වාසී,

කේ. ටී. ටී. එස්. සිල්වා
සහකාර අධිකාරී
සේවක අර්ථසාධක අරමුදල් දෙපාර්තමේන්තුව

අධිකාරී/සේවක අර්ථසාධක අරමුදල්
ශ්‍රී ලංකා මහ බැංකුව

011-2477984
011-2477982
011-2477958
epf@cbsl.lk
www.cbsl.gov.lk